# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය.

**අභියාචනා අංක:- AAT/36/2024 (PSC)**

එච්.අයි.ආර්.විජේපාල
**අභියාචක**
**එදිරිව,**
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය : 2026.05.13**

**ඉදිරියේ දී** **විනිසුරු කේ.ටී.චිත්‍රසිරි (සභාපති)**
**ජේ.ජේ.රත්නසිරි (සාමාජික)**
**එස්.නන්දසේකරන් (සාමාජික)**

පෙනී සිටීම :- අභියාචක සිටී.
අභියාචක වෙනුවෙන් නීතිඥ එම්.වී.එස්.උදයංග මහතා.
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් කේ.මනේෂා නිෂ්ෂංකා මහත්මිය.

**-<u>නියෝගය</u>-**

දෙපාර්ශවයම විසින් ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත දේශන ඇතුළු අනෙකුත් සියළුම කරුණු වලට අවධානය යොමු කරන ලදී. අභියාචක විසින් ඉදිරිපත් කර ඇති 2024.02.02 දිනැති ලිපිය මඟින් ඉල්ලා ඇත්තේ, ඔහු වෙත නිකුත් කර තිබූ චෝදනා පත්‍රයට අදාළ දඬුවම් දෙක සළකා බලා ඔහු වෙත සහන ලබා දෙන ලෙසය. මෙම විනිශ්චය අධිකාරය වෙත 2024.02.02 ඉදිරිපත් කර ඇති අභියාචනා පෙත්සම මඟින් ඉල්ලා ඇත්තේ, ඔහු වෙත ලබා දී ඇති දඬුවම් සියල්ලම සංශෝධනය කරමින් ඔහුව නිදොස් කොට නිදහස් කරන ලෙසත්ය. අභියාචක වෙත පමුණුවා ඇති දඬුවම ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂක ජෙනරාල්ගේ 2021.04.08 දිනැති ලිපියේ සඳහන්ව ඇත.

ඒ අනුව අභියාචක වෙත ඉදිරිපත් කර තිබූ චෝදනා අතුරින් I,IV,V චෝදනාවලට ඔහු වරදකරු බවට පත් කර ඇත. II සහ III දරන චෝදනා වලින් ඔහුව නිදහස් කර ඇත. එම විනය නියෝගය ලබා දී ඇත්තේ, මෙම සිද්ධියට අදාළව විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වූ නිළධාරියා විසින් ලබා දී ඇති තීරණය පදනම් කර ගෙනය. ඒ අනුව අභියාචකගේ වැටුප් වර්ධක දෙකක් අඩු කර ඇති අතර, ඊට අමතරව

කාර්යාලය තුළදී නිසි විනය පවත්වාගෙන යන ලෙසට ඔහුට අවවාදයක්ද කර ඇත. ඒ බව ඉහත කී 2021.04.08 වන දිනැති ලිපියේ සඳහන්ව ඇත.

අභියාචක වරදකරු කරමින් දඬුවම් පනවා ඇති චෝදනා පහත දැක්වේ.

I. ඔබ, සංවර්ධන නිලධාරි සේවයේ III ශ්‍රේණියේ නිලධරයකු වශයෙන් ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්තව සේවය කරමින් සිටියදී මහජන දිනයක් වන 2018.07.11 දින එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන්ට අනතුරක් සිදු විය හැකි ආකාරයෙන් විසකුරු සර්පයෙක් කාර්යාලයට රැගෙන ඒම මගින් වරදක් සිදු කිරීම.

IV. ඔබ, සංවර්ධන නිලධාරි සේවයේ III ශ්‍රේණියේ නිලධරයකු වශයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්තව සේවය කරමින් සිටියදී මහජන දිනයක් වන 2018.07.11 දින එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන්ට අනතුරක් සිදු විය හැකි ආකාරයෙන් විසකුරු සර්පයෙක් කාර්යාලයට රැගෙන ඒමෙන් කාර්යාලයේ කටයුතුවලට බාධා කිරීම හෝ එසේ වීමට හැකි ආකාරයෙන් කටයුතු කිරීම මගින් වරදක් සිදු කිරීම.

V. ඉහත අංක I සිට V දක්වා චෝදනාවල සඳහන් වැරදි එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම සිදු කිරීම මගින් ඔබ දරණ තනතුරත් පොදුවේ රාජ්‍ය සේවයත් අපකීර්තියට පත් කිරීම.

ඉහත කී සියළුම චෝදනාවලට පදනම් වී ඇත්තේ, අභියාචක ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්තව සිටියදී 2018.07.11 දිනය, මහජන දිනයක්ව පැවතියදී එම කාර්යාලයට විසකුරු සර්පයෙක් රැගෙන ඒම සහ එම ක්‍රියාව නිසා කාර්යාලයේ කටයුතු වලට බාධා සිදු කළාය යන කරුණයි. පිඹුරකු යැයි හඳුනාගෙන ඇති විසකුරු සර්පයකු කාර්යාල පරිශ්‍රය තුළට රැගෙන ඒම විවාදයට භාජනය වන්නේ නැත.

ඉදිරිපත් කර තිබූ චෝදනා සනාථ කිරීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත්වී තිබේදැයි මීළඟට සළකා බලන ලදී. අභියාචක වන රිචඩ් විජයපාල යන අය සාක්ෂි දෙමින් පවසා ඇත්තේ, “මූඩිය වහලා තිබුණ ලොකු ප්ලාස්ටික් බෝතලයක් ඇතුලේ සර්පයෙක් හිටියේ. ඒ බෝතලය වැට අයිනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පැත්තෙන්

තිබ්බා. ගැමුණුට එතන ඉන්න කියලා මම ගියා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පැත්තට.'' යනුවෙනි.

ඉහත කී ගැමුණු යන අයද විධිමත් විනය පරීක්ෂණයේදී සාක්ෂි ඉදිරිපත් කර ඇත. ඔහුද සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ, ''විජයපාල මහත්තයා සර්පයා සහිත බෝතලය අරගෙන බලලා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩමෙන් එළියේ කම්බි වැට අයිනෙන් තිබ්බා. තියලා නැවතත් කාර්යාලය දෙසට ගියා.''යනුවෙනි. ඔහු මූලික සාක්ෂියේදී ප්‍රකාශ කර ඇත්තේ, පොලිසියේ වැට කියන්නේ, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ පොලිසිය වෙන් වෙන වැට බවයි.

පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂි දී ඇති චන්ද්‍රානි යන අය ප්‍රකාශ කර ඇත්තේ, ''විජයපාල මහතා මගේ මේසය ළඟට ඇවිත් පොළඟෙක් දමාපු බෑග් එකක් ගෙනාවා එසේ ගෙනවිත්, සර්පයා වනජීවී එකට ගෙනියන්න කියලා කිව්වා'' යනුවෙනි. තවත් සාක්ෂිකරුවකු වන එච්.කේ.නිහාල් යන අය පවසා ඇත්තේ, අභියාචක සර්පයකු ගෙනාපු බව සර්ට කියනවා මට ඇහුන බවයි. සර් යනුවෙන් හැඳින්වූයේ ප්‍රාදේශීය ලේකම් බවටද ඔහු සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත. ඔහු වැඩිදුරටත් හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් පවසා ඇත්තේ, ප්‍රධාන කළමනාකාර සහකාර වන චන්ද්‍රානි මහත්මියගේ රාජකාරී මේසය ළඟ එවැනි පාර්සලයක් තිබෙනවා දුටු බවයි. ප්‍රසංග උදයකාන්ත යන සාක්ෂිකරුද ප්‍රකාශ කර ඇත්තේ, ඔහු අභියාචකගෙන් විමසූ විට අභියාචකගෙන් ගෙන ආ සර්පයා මොකෙක්ද කියා විමසූ බවයි. පද්මකුමාර යන සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ, චූදිත විජේපාල මහතා රැගෙන ආ පාර්සලය බිම තියලා තිබෙනවා බව ඔහු දුටු බවත්, එම පාර්සලය තුළ විනිවිද පෙනෙන බෝතලයක් තිබූ බවත් එහි සර්පයෙක් සිටි බවත්ය. ඒ අවස්ථාවේදී කාර්යාලයේ අනෙකුත් නිලධාරීන්ගෙන් සමහර දෙනෙක් පැමිණ අදාළ බෝතලයේ සිටි සර්පයා බැලූ බවටද ඔහු විසින් ප්‍රකාශ කර ඇත. ඉහත සාක්ෂි අනුව පැහැදිළිව පෙනී යන්නේ, අභියාචක ඔහු සේවය කරන ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රය තුළට සර්පයෙක් රැගෙනවිත් ඇති බවයි.

කෙසේ වෙතත්, සුළු වේලාවකින් අනතුරුව සර්පයා ගෙන ආ ගැමුණු යන අය වෙත ආපසු භාර දී ඇත. ඉදිරිපත්ව ඇති සාක්ෂි, සමූහයක් ලෙස සළකා බලන විට, අභියාචක විසින් කර ඇති ක්‍රියාව කාර්යාලයේ රාජකාරිය ක්‍රියාත්මක කිරීමට බාධා වන අයුරින් කටයුතු කිරීමේ චේතනාවක් ඔහු තුළ නොතිබූ බව පෙනී යයි. එම සර්පයා විනාඩි 10-15 ක් පමණ සුළු වේලාවක් ඇතුළත ආපසු එම ස්ථානයෙන් ඉවත් කර ඇත. එයින් පැහැදිළි වන්නේ, අභියාචක පවසන අන්දමට එම සර්පයා වනජීවී

දෙපාර්තමේන්තුවට භාර දීම සඳහා ඔහු කිසියම් සහයක් පල කිරීමට උත්සාහ දරා ඇති බවයි.

කෙසේ වෙතත් අභියාචක යහපත් චේතනාවෙන් මෙම ක්‍රියාව සිදු කළත්, ප්‍රශ්නගත සර්පයා කාර්යාල පරිශ්‍රය තුළට රැගෙන යාමට ගෙන ඇති ක්‍රියාව අනුමත කළ නොහැකි අතර එම චෝදනාවටව ඔහු වරදකරු කිරීමේ දෝශයක් පෙනෙන්නට නැත.

කෙසේ වෙතත් සියළුම සිද්ධීන් සළකා බලන විට විශේෂයෙන්ම අභියාචකගේ යහපත් චේතනා ගැන අවධානය යොමු කළ විටදී ඔහු වෙත පනවා ඇති දඬුවම අධික බවට විනිශ්චය අධිකාරයේ මතය වේ. එම කරුණු සළකා බලා අභියාචක වෙත 2021.04.08 දිනැති ඒකාබද්ධ සේවා අධ්‍යක්‍ෂ ජනරාල් වෙත නිකුත් කර ඇති විනය නියෝගය, බරපතල වැඩි දඬුවමක් සේ සළකා ඔහු වෙත පනවා ඇති වැටුප් වර්ධක දෙක අඩු කරමින් ලබා දී ඇති විනය දඬුවම ඉවත් කර, ඒ වෙනුවට ඉදිරිපත් කර ඇති චෝදනා සම්බන්ධයෙන් දඬුවමක් ලෙස, ඔහුගේ වැටුප් වර්ධක එකක් අඩු කළ යුතු බවට නියෝග කරමු.

ඉහත කොන්දේසිවලට යටත්ව, අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචනයට අවසර දීමට තීරණය කරමු.

කොන්දේසිවලට යටත්ව අභියාචනයට අවසර දෙමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

දෙව්මිනි/